**අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2025**
**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ("විද්‍යායතනය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- විද්‍යායතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- විද්‍යායතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 වර්ෂයට අදාළ ශිෂ්‍යාධාර ගෙවීම් වෙනුවෙන් 2026 ජනවාරි 06 දින ලැබී තිබු රු.මිලියන 3.78 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06 හි 8 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේ වූවත් ශිෂ්‍යාධාර ගෙවීම් වියදම 2025 වර්ෂයේදී උපචිත පදනමින් ගිණුම්ගතකර තිබුණු බැවින් රු.මිලියන 3.78 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඌනතාවය අධිගණනය වී තිබුණි. | ශිෂ්‍යාධාර ගෙවීමට ඇති මුදල උපචිත වියදමක් බැවින් එම වියදම උපචිත පදනම යටතේ ගිණුම් ගත කර ඇත. කෙසේ වුවද ආදායම් ආරක්‍ෂණ සංකල්පය යටතේ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කර නැති බව. | ප්‍රමිතය අනුව වර්ෂයට අදාළ සියලු ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 40 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය සඳහා යම් කිසි අස්ථිත්වයක් පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය සිය ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරාගත යුතු වුවත් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන සටහන් 3.1 යටතේ පිරිවැය/ප්‍රත්‍යාගණන අගය යන දෙකම සඳහන් කර තිබුණු නමුත් කුමන වත්කම් පන්ති සඳහා පිරිවැය ආකෘතිය භාවිතා කරන්නේද කුමන වත්කම් පන්ති සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරන්නේද යන්න හඳුනාගත නොහැකි විය. | අවසන් ගිණුම් තුල දේපළ පිරියත හා උපකරණ යටතේ , සියළු වත්කම් පිරිවැයට අගය යටතේ දක්වා ඇත . එය අවසන් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 10 යටතේ දක්වා ඇති බව | ප්‍රමිත 07 හි 40 ඡේදයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු බැවින් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එකතුව රු.මිලියන 105.73 ක් වූ වත්කම් විෂයයන් 03 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණ ද මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | මෙම සම්පූර්ණයෙන්ම ක්ෂය වී අවසන්ව ඇති වත්කම් තුල ඇති බොහොමයක් වත්කම් මේ වන විට භාවිතයෙන් ඉවත් කොට ඇති අතර , කොටසක් පමණක් | ප්‍රමිත 07 හි 65 ඡේදයට අනුකූලව තවදුරටත් භාවිතා කරන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 |

| | | | |
|---|---|---|---|
| | | භාවිතා කරනු ලබයි . එම තව දුරටත් භාවිතා කරනු ලබන වත්කම්හි වටිනාකම් නැවත ආගණනය කොට ඉදිරි ගිණුම් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ප්‍රකාරව ප්‍රතිශෝධනය කළ යුතු අතර භාවිතයෙන් ඉවත් කර ඇති වත්කම් අපහරණය කර පොත්වලින් ඉවත් කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 77 හා 141 ඡේද ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් කිරීමේදී ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම්ද මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 3.3 (ඇ) යටතේ සේවක ප්‍රතිලාභ වගකීම වර්තමාන අගය යටතේ වාර්තා කර ඇති බව දක්වා තිබුණි. | ප්‍රවර්ථන වර්ෂය අවසානයේදී විද්‍යායතනයේ සිටි මුළු ස්ථිර සේවක සංඛ්‍යාව 26 ක් වන අතර ඉන් වර්ෂයකටත් වඩා වැඩි සේවා කාලයක් සහිත සේවක සංඛ්‍යාව 25 කි. එබැවින් සේවක පාරිතෝෂිත වෙන් කිරීම වර්තමාන වටිනාකම් යටතේ වෙන් කර ඇත. | ප්‍රමිත 19 පරිදි පාරිතෝෂික වෙන්කිරීමේදී ආයු ගණක තක්සේරු ක්‍රමය භාවිතා කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයතනය විසින් එකතුව රු.මිලියන 5.42 ක ස්ථාවර තැන්පතු 5 ක් පවත්වා ගෙන තිබුණද ඒ සඳහා පනත ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහ අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට ප්‍රථමව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන ඇති බව. | මුදල් පනත ප්‍රකාරව සෑම මුදල් ආයෝජනයකට ම ප්‍රථම අදාළ අනුමැතීන් ලබාගත යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) සහ 38 (2) වගන්ති | ආයතනයේ ගණන්දීමේ නිළධාරියා විසින් මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන බවට සහතික විය යුතු අතර කාලීනව සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදුකල යුතු වුවත්, අදාළ සමාලෝචනය සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කරන බව. | විගණන පනත පරිදි ගණන්දීමේ නිලධාරියා විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය කලින් කල සමාලෝචනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.536,885 ක වැඩබැලීමේ වැටුප් ගෙවා තිබුණි. | මෙම වැඩබැලීමේ දීමනා විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලයේ හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත ගෙවා ඇත. තවද රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයකුද වන අතර ඒ සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය නිතැතින්ම ලැබී ඇත. | ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| | i. මුදල් රෙගුලාසි 571 | වසර 2කට වැඩි කාලයක සිට පැවත එන පාඨමාලා සම්පූර්ණ නොකර අතහැර ගොස් තිබුණු ශිෂ්‍යයින් 250 දෙනෙකුට අයත් රු.මිලියන 1.08 ක පුස්තකාල තැන්පතු මුදල් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව රජයේ ආදායමට බැරකර නොතිබුණි. | එම මුදල් පාඨමාලා නිම කිරීමෙන් පසුව නැවත සිසුන්ට ගෙවනු ලැබේ. පාඨමාලා හැර ගිය සිසුන් හට නැවත මෙම පුස්තකාල තැන්පතු ආපසු නොගෙවීම සම්බන්ධ තීරණයක් ගෙන නොමැත. එම නිසා ඉදිරියේදී කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කොට එම තැන්පතු මුදල් ගෙවීමට හෝ නොගෙවන්නේ නම් ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු බව. | පාඨමාලා හැරගිය සිසුන්ගේ පුස්තකාල තැන්පතු සම්බන්ධ ප්‍රතිපත්තියක් සකස්කර ඒ අනුව කල්ගත වූ තැන්පතු ආදායමට ගත යුතුය. |
| | ii. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර අදාළ වාර්තා එළඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත භාර දිය යුතු වුවත් විද්‍යායතනය විසින් 2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණු අතර 2025 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවද 2026 මැයි 29 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර වත්කම්වල පැවැත්ම තහවුරු කල යුතුය. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (i) සහ | සියලුම රාජ්‍ය සේවකයින්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවත් විද්‍යායතනයේ | මෙම අවස්ථා 74 තුල ඇති පිටවීම් අවස්ථා 12 ක දී විදුලිය විසන්ධි වීමෙන් පසුව ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා | චක්‍රලේඛය පරිදි පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර |

| | | | | |
|---|---|---|---|---|
| | 02 (iv) ඡේදය | නිලධාරීන්ගේ ඇඟිලි සලකුණු වාර්තා පරීක්ෂා කිරීමේදී නිලධාරීන් 26 දෙනෙකු අවස්ථා 74 කදී පැමිණීම හෝ පිටවීම සටහන් කර නොතිබුණි. එසේම අතිකාල ගෙවීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර ගත යුතු වුවත් එසේ සනාථ කර නොගෙන නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් රු.119,526 ක අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි. | විරහිතවීම නිසා පිටවීමේදී එදින ඇඟිලි සළකුණු සටහන් තැබීමට නොහැකිවී ඇත. අනෙකුත් දිනයන් සඳහා සේවකයින්ගෙන් කරුණු විමසීමක් සිදුකර වාර්තාවක් ලබාගැනීමට සැලසුම් කර ඇත. තවද මෙම සියළු අවස්ථා පැමිණීමේ හා පිටවීමේ ලේඛනයෙහි අත්සන් තබා ඇත. මේ සම්බන්ධයෙන් විධිමත්ව සියලුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති අතර 2026 වර්ෂයේ සිට මෙය විධිමත්ව පවත්වා ගෙන යනු ලැබේ. | මගින් තහවුරු කල යුතුය. |
| (ඊ) | තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2014 පෙබරවාරි 10 දිනැති අංක ඩීඑම්එස්/1670 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 4 (අ) ඡේදය | නියමිත දිනට පෙර භාරදෙන පිළිතුරු පත්‍ර සඳහා පමණක් පිළිතුරු පත්‍ර ඇගයීම් ගාස්තු ගෙවිය හැකි වුවද විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් 2025 වර්ෂයේ පැවැත්වූ සියළුම විභාග ප්‍රතිඵල නියමිත මාස 3 ක කාලය තුල නිකුත් කර නොතිබියදී යොමුගත චක්‍රලේඛයට පටහැනිව සම්පූර්ණ මුදල වන රු.995,758 ක් ඇගයීම් ගාස්තු ලෙස ගෙවීම් කර තිබුණි. | අභ්‍යන්තර විභාග පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා, අනුමත කරන ලද කාල සීමාවක් සම්බන්ධයෙන් අනුමත කරන ලද විධිමත් කාර්යපටිපාටියක් නොමැත. කෙසේ වුවද, යෝජනා වූ කාර්යපටිපාටියට අනුව මාස 03 ක කාලයක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළයුතු වුවත් එය ප්‍රායෝගික වශයෙන් සංශෝධනය කර මෙම වර්ෂයේ සිට (2026) එය අධ්‍යයන මණ්ඩල අනුමැතිය මත සාධාරණ කාලසීමාවක් තුළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමටත්, ඒ අනුව ගෙවීම් සිදු කිරීමටත් බලාපොරොත්තු වන බව | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නියමිත දිනට පෙර භාරදෙන පිළිතුරු පත්‍ර සඳහා පමණක් ඇගයීම් ගාස්තු ගෙවිය යුතුය. |
| (උ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතහි 6.6 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ එම වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විද්‍යායතනය විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතන විසින් වෙන් වෙන් වශයෙන් වාර්ෂික වාර්තා පිළියෙල නොකරනු ලබන අතර වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතනද ඇතුළත් කොට වාර්ෂික වාර්තා පිළියෙල කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව විද්‍යායතනයට අදාල වාර්ෂික | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වාර්තාවද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන බව. | |
| (ඌ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 3.2 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ගතවීමට පෙර සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යය සාධන සමාලෝචන රැස්වීම (APRM) පැවැත්විය යුතු වුවත් විද්‍යායතනය විසින් මේ දක්වා එම රැස්වීම් පවත්වා නොතිබුණි. | සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතන විසින් වෙන් වෙන් වශයෙන් වාර්ෂික කාර්යය සාධන සමාලෝචන රැස්වීම් නොපවත්වනු ලබන අතර, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් සියළුම විශ්වවිද්‍යාල විද්‍යායතනද ඇතුලත් කොට වාර්ෂික කාර්යය සාධන සමාලෝචන රැස්වීම් පවත්වන බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එක් එක් විද්‍යායතනය විසින් වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම පැවැත්විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.26,438,973 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.18,265,671 විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,173,302 ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම සහ මෙහෙයුම් වියදම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා 6 ක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශය අනුව න්‍යායාත්මක පැය 10,769 ක්ද ප්‍රායෝගික පැය 4,988 ක්ද ආවරණය කල යුතු වුවත් විද්‍යායතනය විසින් න්‍යායාත්මක පැය 7,463 ක් සහ ප්‍රායෝගික පැය 3,412 ක් පමණක් ආවරණය වන පරිදි සැලසුම් සකස් කර තිබුණි. ඒ අනුව න්‍යායාත්මක හා ප්‍රායෝගික පැය පිළිවෙලින් සියයට 31 ක් හා සියයට 32 ක් ආවරණය කර නොතිබුණි. මේ සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතියද ලබාගෙන නොතිබුණි. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ යොමුවට අනුව, සති 15 ක් සමාසිකයක් තුල ප්‍රායෝගිකව සතියකට යොමුකළ හැකි උපරිම theory සහ Practical පැයගණන පැය 525 කි (7*5*15). මෙම මොඩියුල පැය ගනනට අමතරව IT සහ English සතියට පැය 2 බැගින් පැය 30ක් ආවරණය කල යුතුවේ. එලෙස ඔබ දක්වා ඇති නිදසුනට අනුව ප්‍රායෝගිකව මොඩියුල සඳහා අපට ඇති කාලය උපරිම පැය 495 කි. මෙම සීමාව යටතේ කළමනාකරණය කරගතහැකි උපරිම සීමාව දක්වා theory | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශය අනුව පාඨමාලාවේ ගුණාත්මක බව ආරක්ෂා වන පරිදි ඉගෙනුම් පැය ආවරණය කළ හැකි පරිදි සැලසුම් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සහ Practical පැයගණන දී ඇති අනුපාතයන්ට අනුව ගණනය කර පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා වූ ප්‍රායෝගික කලරාමුව ඉදිරිපත් කර ඇත. | |
| (ආ) | විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6 (ඈ) ඡේදය ප්‍රකාරව විද්‍යායතනයේ අධ්‍යන කාර්යය මණ්ඩලය විසින් සතියකට අවම වශයෙන් ඉගෙනුම් පැය 25 ක් ආවරණය කළ යුතු වුවත් ඊට පටහැනිව විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකු විසින් සතියකට පැය 14 සිට පැය 24 දක්වා පරාසයක ඉගෙනුම් පැය ප්‍රමාණයක් ආවරණය වන පරිදි පෞද්ගලික කාල සටහන් සකස් කර තිබුණි. | අදාල සමාසිකයේ පවතින අධ්‍යයන කණ්ඩායම් ගණන, පැවති මොඩියුලයේ පැය ගණන, මෙහෙයුම් අත්පොතෙහි සඳහන්ව ඇති පැය 25ක කාලරාමුව වැනි සාධක සලකා බැලීමෙන් අනතුරුව වඩා ප්‍රායෝගික හා කාර්යක්ෂම අයුරින් අදාළ කාලය කළමනාකරණය කරන ලද ඉගෙනුම් කාලසටහන අධ්‍යයන මණ්ඩලයේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක වේ. තවද මෙහෙයුම් අත්පොතෙහි සඳහන්ව ඇති 6.0.D ට අනුව අධ්‍යක්ෂක විසින් පවරන අමතර රාජකාරි හා තනතුරු වලට අදාළ කටයුතුද මීට පරිභාහිරව සිදු කරන බව. | විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6 (ඈ) ඡේදය ප්‍රකාරව අවශ්‍ය ඉගෙනුම් පැය ආවරණය වන පරිදි කාල සටහන් සකස් කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2015-2025 කාලපරිච්ඡේදයේදී පාඨමාලා සම්පූර්ණ නොකර අතහැර දමා තිබුණු සිසුන් ප්‍රමාණය ( drop out ) පාඨමාලා සඳහා බඳවාගත් සිසුන්ගෙන් සියයට 40 ත් සියයට 63 ත් අතර ඉහළ ප්‍රතිශතයක් විය. මෙලෙස සිසුන් පාඨමාලා අතහැර යෑමට හේතු වී ඇති කරුණු පිළිබඳ අධ්‍යයන කර ඊට අදාළව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට විද්‍යායතනයේ කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. | බඳවා ගත් සිසුන් ප්‍රමාණය හා එම සිසුන් අතරින් පාඨමාලා නිමකර සහතික ලබාගත් සිසුන් ප්‍රමාණයන් සසඳා ප්‍රතිශතයක් ලෙස ගනණය කිරීමේදී 2015 කණ්ඩායමේ සිට 2019 කණ්ඩායම දක්වා පාඨමාලා සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය ක්‍රමානුකූලව වර්ධනය වී ඇත. නමුත් 2020 කණ්ඩායමේ සියයට 63 ක අගයක් පෙන්වන්නේ එම කණ්ඩායම සඳහා පාඨමාලාව සම්පූර්ණ කිරීමට අවුරුදු 5ක අධ්‍යයන කාලයක් ගතවී ඇති බැවිනි. ඉදිරි සමාසික වල ඔවුන් එය සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වේ. | අතරමඟ පාඨමාලා හැර යන සිසුන් ප්‍රමාණය අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2013 වර්ෂය තුළ විද්‍යායතනය වෙත වෙන්කර දී තිබුණු අක්කර 2 රූඩ් 3 පර්චස් 17 ක ඉඩමේ පිහිටි අනුරාධපුර කාර්මික විද්‍යාලයට අයත් නිල | අදාල ඉඩම විද්‍යායතනය වෙත පවරා දෙන ලෙස අවස්ථා ගණනාවකදී වෘත්තීය | විද්‍යායතනයේ අධ්‍යයන සහ පරිපාලන කටයුතු |

| | | |
|---|---|---|
| නිවාස දෙක සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉවත් කර නොගැනීම හේතුවෙන් විගණිත දින දක්වා විධිමත්ව විද්‍යායතනය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ඉඩමේ පර්චස් 100 ක පමණ කොටසෙහි පිහිටි තනි ගොඩනැගිල්ලක සියලු අධ්‍යයන කටයුතු හා පරිපාලන කටයුතු සිදු කිරීම හේතුවෙන් ඉඩකඩ සීමා වීම හා වෙනත් හේතු මත වාර්ෂිකව පාඨමාලා සඳහා ශිෂ්‍යයින් 600 ක් පමණ ඉල්ලුම් කලද ශිෂ්‍යයින් 240 කට පමණ සීමා කිරීමක් කර අධ්‍යයන කටයුතු සිදුකරමින් පැවතුණි. | තාක්ෂණ විශ්වවිද්‍යාලය හා රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ වූ සාකච්ඡාවන් ගණනාවක් සඳහාද විද්‍යායතනයේ නිලධාරීන් සහභාගි වී ඇත. තවද ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී සිදු කරන ලද සාකච්ඡාවකින් පසුව විද්‍යායතනය ඉදිරිපිට ඇති අදාල ඉඩම් කොටස හා එහි දැනට පිහිටා ඇති නිල නිවාසය විද්‍යායතනය වෙත භාර දීමට එකඟ වී ඇත. | සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කරවාගෙන කාර්යක්ෂම සහ ඵලදායී ලෙස විද්‍යායතනය පවත්වා ගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩනැඟිලි සේවා තාක්ෂණය පිළිබඳ කථිකාචාර්යය (පරිවාස) තනතුර සඳහා විද්‍යායතනය විසින් 2016 වර්ෂයේදි බඳවාගෙන තිබුණු අයදුම්කරුට බඳවාගැනීම් පරිපාටිය අනුව අවශ්‍ය අවම සුදුසුකම් නොතිබුණු අතර එම අයදුම්කරු විසින් ලබාගෙන තිබුණු තාක්ෂණවේදී උපාධිය එකී තනතුර සඳහා අවශ්‍ය විශේෂ හෝ ගෞරව උපාධියක් නොවන බවත් එය සාමාන්‍ය උපාධියක් (SLQF Level 05) පමණක් විය. | මෙම කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා වෘත්තීය තාක්‍ෂණ විශ්වවිද්‍යාලය වෙත දැනුම් දී ඇති අතර එම උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සහිත නිලධාරීන් පමණක් බඳවා ගත යුතුය. |
| (ආ) | 2025 දෙසැම්බර් 31 දින වනවිට විද්‍යායතනය විසින් සේවක විනය කටයුතුවලට අදාලව 2025 වර්ෂයේ ජනවාරි මස මූලික විමර්ෂණ දෙකක් ආරම්භ කර තිබුණද ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14 වගන්තියේ සිට 23 වගන්තිය දක්වා වන කාර්ය පටිපාටි ක්‍රියාත්මක කර එම සේවකයින් වෙනුවෙන් 2026 මැයි මස වන විටත් සුදුසු විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත්ව ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 14-23 වගන්ති වල විධිවිධාන අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |